සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

12

I පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන
"අදිති"

පැය 01 යි

විභාග අංකය ..............................


**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |


01. පහත රූප අතරින් එකක් වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.



A B C D

i. A ii. C iii. D


02. දී ඇති රූප දෙකක් සමානය. දෙකක් අසමානය. අසමාන රූප යුගලය තෝරන්න.



A B C D

i. AC ii. BD iii. DC

- **සතුන්ගෙ රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A B C D E F

03. D හා F සතුන්ට විශේෂ නමුත් B හා E සතුන් ළඟ නොමැති ලක්ෂණයකි,

i. ශාක භක්ෂක සතුන් වීම

ii. නිශාචර සතුන් වීම

iii. පලතුරු වර්ග ආහාරයට නොගැනීම

04. A,C,D සතුන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. මාංශ භක්ෂක වීම ii. ශාක භක්ෂක වීම iii. පාද හතරක් තිබීම

05. 436, 423, 456, 414, 464 යන සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියූ විට මැද සංඛ්‍යාවේත් මුල් සංඛ්‍යාවේත් වෙනස වන්නේ,

i. 22 ii. 14 iii. 12


06. වෙළෙඳ සැලක ගිනිපෙට්ටි 4ක් ගත් විට එකක් නොමිලේ ලැබේ. තාත්තා ගිනිපෙට්ටි 15ක් ගෙනාවේ නම් ඔහු මිල දී ගත් ගිනිපෙට්ටි ගණන වන්නේ,

i. 12කි ii. 10කි iii. 15කි

07. නිවසක මිනිත්තු 10,15,20 ලෙස පිළිවෙළින් දැල්වෙන බල්බ 3ක් ඇත. බල්බ තුනම පෙ.ව.8.00ට දැල්විණි. නැවත බල්බ තුනම දැල්වෙන්නේ,


i. පෙ.ව.9.30ට    ii. පෙ.ව.9.00ට    iii. පෙ.ව.8.40ට

08. නංගී කඩදාසි පටියක් පහත පරිදි කපා වෙන් කර ඇත. එය නිවරුදි ව නැවත සකස්කර ගැනීමට ගැළපිය යුතු ආකාරය වන්නේ,




i. D B C A    ii. D C B A    iii. A B C D

09. මුළු රූපයේ වටේ දිග අඳුරු කළ කොටසේ වටේ දිග මෙන් කී ගුණයක් ද?



i. දෙගුණයකි
ii. හතර ගුණයකි
iii. තුන් ගුණයකි

10. දින 30කින් අවසන් වන මාසයක පළමු වෙනිදා සඳුදාවකි. එම මාසයේ 29 වෙනිදා වන්නේ,

i. අඟහරුවාදා    ii. සිකුරාදා    iii. සඳුදා

11. පහත සංඛ්‍යා ආරෝහණ ක්‍රමයට සැකසීම සඳහා සංඛ්‍යා කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

| | | | | |
|---|---|---|---|---|
| 15 | 22 | 20 | 18 | 27 |

i. 4    ii. 2    iii. 3

12. මිතුරන් 10 දෙනෙක් වෘත්තාකාර මේසක් වටා වාඩි වී සිටියි. ඔවුන් පිළිවෙළින් 1 සිට ගණන් කරයි. මහේල අංක 1 කියා පටන් ගත්තේ නම්, ඔහු තුන්වන වර කියන සංඛ්‍යාව වන්නේ,

i. 21    ii. 20    iii. 11

13. මීටර 200 ධාවන තරගයක් නිම කිරීමට ගත් කාලය පහත දක්වා ඇත.

| | |
|---|---|
| සුදත් | විනාඩි 1 තත්පර 36 |
| මලිත් | විනාඩි 2 තත්පර 05 |
| දුලාන් | විනාඩි 1 තත්පර 11 |
| මිලාන් | විනාඩි 1 තත්පර 43 |

මෙහි පිළිවෙළින් ප්‍රථමයා හා අන්තිමයා වන්නේ,

i. මලිත් - මිලාන්    ii. සුදත් - දුලාන්    iii. දුලාන් - මලිත්

14. යාපනයේ සිට කොළඹ යන බස් රථයක් පිළිවෙළින් පසු කළ නගර තුනක් නිවැරදි ව දක්වා ඇත්තේ,

i. අනුරාධපුර, කුරුණෑගල, වවුනියාව

ii. කුරුණෑගල, වවුනියාව, අනුරාධපුර

iii. වවුනියාව, අනුරාධපුර, කුරුණෑගල

15. පහත ඒවායින් නොගැළපෙන වචනයක් සහිත පිළිතුර වන්නේ,

i. දශකය, අඩ සියවස, සියවස, සහශ්‍රය

ii. මිලි මීටර, සෙන්ටි මීටර, මීටර, කිලෝ මීටර

iii. වරක්කලය, අතංගුව, කෙමන, මා දැල

16. කාන්තාවන් තිදෙනෙක් ඇඳුමක් මැසීමට ගත කළ කාලය පහත දැක්වේ. ඒ අනුව වඩාත් නිවැරදි අදහස ගෙන දෙන පිළිතුර වන්නේ,

**මතීෂා - මිනිත්තු 110**

**යෙනුලි - පැය 1 යි මිනිත්තු 50**

**සෙනුල්යා- පැය 1 1/2 යි මිනිත්තු 20**

i. මතීෂාට වැඩි කාලයක් ගත වී ඇත

ii. යෙනුලිට හා සෙනුල්යාට සමාන කාලයක් ගත වී ඇත.

iii. තිදෙනාට ම සමාන කාලයක් ගත වී ඇත.

17. මයුරි, පවනී, දනුදි ළඟ යම් මුදල් ප්‍රමාණයක් ඇත. පවනිගෙන් රු10ක් දනුදිට දුන් විට දනුදිගේ මුදල රු30ක් වේ. දනුදි ළඟ කලින් තිබූ මුදල මෙන් දෙගුණයක් මයුරි ළඟ ඇත. පවනි දනුදිට රු10ක් දුන් පසු ඉතුරු මුදල, මයුරි ළඟ ඇති මුදල ට සමානය. තිදෙනා ළඟම ඇති මුදල් ප්‍රමාණය වන්නේ,

i. රු.110කි. ii. රු.80කි. iii. රු.120කි.


18. රිසිත් සවස පංති නිම වී නිවසට එන විට ඔහුගේ වම් අත පැත්තට ඔහුගේ සෙවණැල්ල වැටී තිබුණේ නම්, ඔහු ගමන් කරන්නේ කුමන දිශාවට පිටුපාල ද?

i. උතුර ii. දකුණ iii. බස්නාහිර

19. වැරදි ප්‍රකාශය තෝරන්න

i. $7 \times 7 + 1 \times 2 = 100$ ii. $8 \div 2 \times 5 + 5 = 100$ iii. $5 \times 0 + 20 \times 4 = 100$


20. හිස් කොටස ට ගැළපෙන පිළිතුර තෝරන්න.




i.   ii.   iii. 

21. මුල් ඉලක්කම් වල තීන්ත තවරා එම පටිය දෙකට නැමූ විට ලැබෙන නිවැරදි රූපය වන්නේ,

| 806 | |
|---|---|

i. 680  ii.   iii. 806


22. A සිට D දක්වා ඇති දුර වන්නේ,




(දුර km වලින් දක්වා ඇත)

i. 49km  ii. 41 km  iii. 39 km

23. B රූපය ප්‍රමාණයට A රූපයෙන් කොටු කීයක් කපා ගත හැකි ද?




i. 36  ii. 30  iii. 6

24. විලක පෙර දිනයේ පිපී තිබූ මල් ගණන මෙන් දෙගුණයක් ඊ ළඟ දිනයේ පිපෙයි. දින 4ක් යන විට විලේ හරි අඩක් මල් පිපී තිබුණි. විලේ සම්පූර්ණයෙන් ම මල් පිපීමට තව දින කීයක් ගත වේ ද?

i. 4යි  ii. 1යි  iii. 5යි

25. පූසා සර්ව භක්ෂකයෙකි. පහන්ගේ සුරතලා ද සර්වභක්ෂක සතෙකි. ඒ අනුව පහන්ගේ සුරතලා පිළිබඳ එළඹිය හැකි හොඳම නිගමනය වන්නේ,

i. නිසැකව ම පූසෙක් වේ.

ii. පූසෙක් නොවේ. සර්ව භක්ෂකයෙක් වේ.

iii. පූසෙක් වීමට හෝ නොවීමට පුළුවන.

26. ඖෂධ ඉපදුනේ එක්තරා වර්ෂයක මැයි මාසයේ අවසාන ඉරිදාය. හිරුන් ඉපදුනේ එම වර්ෂයේ ම ජුනි මාසයේ මුල් ම ඉරිදා ය. මෙම දින දෙකෙහි එකතුව 34 කි. ඒ අනුව ඖෂධ ගේ උපන් දිනය මැයි මාසයේ,

i. 29 වේ. ii. 05 වේ. iii. 31 වේ.

27. රොහාන්, මොහාන් මෙන් දෙගුණයක් වයස ය. කුසල් රොහාන් මෙන් දෙගුණයක් වයසය. තිදෙනාගේ ම වයස්වල එකතුව අවුරුදු 49 කි. ඒ අනුව කුසල්ගේ වයස වන්නේ,


i. අවුරුදු 14 ii. අවුරුදු 28 iii. අවුරුදු 7

28. ඉඩමකින් $\frac{1}{4}$ ක පොල් ද, $\frac{2}{8}$ ක අඹ ද, වගා කර ඇත. වගා නොකරන ලද බිම් ප්‍රමාණය කොපමණ ද?

i. $\frac{1}{2}$ ii. $\frac{5}{8}$ iii. $\frac{1}{4}$

29. ක්‍රීඩා පිටියක ටුනාරා, ෆියෝනාට මීටර් 50ක් බටහිර දිශාවෙන් සිටියි. ෆියෝනා, ටුනාරා දෙසට ගමන් අරඹන මොහොතේ ම ටුනාරා, ෆියෝනාගේ වේගය මෙන් දෙගුණයක වේගයකින් බටහිර දිශාවට ම ගමන් කරයි. ෆියෝනා 20mක දුරක් ටුනාරා දෙසට ගමන් කළ විට දෙදෙනා අතර දුර මීටර කීය ද?

i. 70m ii. 90m iii. 120m

30. 

මෙම රූපයේ දැක්වෙන්නේ හරි හතරැස් ලී කුට්ටියකි. එහි මතු පිට රතු පාට තීන්ත ආලේප කර, ඉරි දිගේ කුඩා කැබැලි වලට කපා වෙන් කර ගත් විට කැබලි 27ක් ලැබුණේ නම්, එම කැබැලි වල තුන් පැත්තක පමණක් තීන්ත ගෑවී තිබූ කැබැලි කීයක් දැක ගත හැකි වේ. ද?

i. 12කි. ii. 8කි. iii. 10කි.


31. 2012 පෙබරවාරි මස 29 දින උපත ලද ළමයෙක් 2024 පෙබරවාරි 29 දින සමරන්නට ඇත්තේ ඔහුගේ උපන් දින අතරින් කී වෙනි උපන් දින සැමරුම විය හැකි ද?

i. 12 වෙනි ii. 11 වෙනි iii. 3 වෙනි


32. එක්තරා ළමයෙකුගෙන් තම නිවස පිහිටා ඇති ස්ථානය ඇසු විට ඔහුගේ පිළිතුර වූයේ ප්‍රධාන පාරෙන් වමට ඇති පළමු පාරේ මුලින්ම ඇති විදුලි කණුවේ සිට විසිවෙනි විදුලි කණුව ඉදිරි පිට තම නිවස පිහිටා ඇති බවයි. විදුලි කණු දෙකක් අතර දුර 50m ක් නම්, ළමයාගේ නිවස පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයේ සිට කොපමණ දුරකින් ද?

i. 950m ii. 1000m iii. 900m


- **පහත සටහන දෙස බලා 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



රු. 240.00



රු. 105.00



රු. 255.00

33. ඉහත සටහන අනුව පේර ගෙඩියක මිල කොපමණ ද?

i. රු. 40.00 ii. රු. 15.00 iii. රු. 50.00

34. අන්නාසි ගෙඩි දෙකක්, අඹ ගෙඩි දෙකක් හා ගස්ලබු ගෙඩි දෙකක් මිල දී ගත් අයෙක් කොපමණ මුදලක් ගෙවිය යුතු ද?

i. රු. 305.00 ii. රු. 550.00 iii. රු. 480.00

35.

○ × ○ = △


△ + △ = □

△ × △ = 16 නම්

□ + □ + △ + ○ හි අගය කීය ද?

i. 24 ii. 32 iii. 22

36. පහත සඳහන් රූපයේ දැකිය හැකි චතුරස්‍ර ගණන කොපමණ ද?



i. 3කි
ii. 7කි
iii. 8කි

37. 45 සිට 105 දක්වා සංඛ්‍යා ලිවීමේ දී 5 ඉලක්කම ලිවිය යුතු වාර ගණන කීය ද?

i. 16කි ii. 17කි iii. 15කි


38. 2024 වර්ෂය අයත් වන්නේ කිනම් සියවසක, කී වෙනි දශකයට ද?

i. විසිවන සියවසේ තෙවන දශකයට

ii. විසි එක්වන සියවසේ තෙවන දශකයට

iii. විස් එක්වන සියවසේ හතරවන දශකයට

39. පහත දී ඇති හැඩය සමචතුරස්‍රයක් බවට පත් කිරීම සඳහා එකතු කළ යුතු අවම කොටු සංඛ්‍යාව කීය ද?



i. කොටු 7
ii. කොටු 12
iii. කොටු 17

40. සමිතියක සාමාජිකයෝ දහදෙනක් සිටිති. සෑම මාස දෙකකට වරක් ම සාමාජිකයන්ගේ නාම ලේඛනයේ අනුපිළිවෙළට එක් එක් සාමාජිකයාගේ නිවසේ සමිති රැස්වීම පැවැත්වේ. අජිත් මහතාගේ නිවසේ පළමු රැස්වීම පැවැතියේ 2024 මාර්තු මාසයේ දී ය. ඔහුගේ නිවසේ මීළඟට රැස්වීම පැවැත්වෙන්නේ කවර මාසයේ ද?

i. 2025 ඔක්තෝම්බර් මස
ii. 2024 දෙසැම්බර් මස
iii. 2025 නොවැම්බර් මස